මහජන බැංකුව | மக்கள் வங்கி

**PEOPLE'S BANK**

# <u>ටෙන්ඩර් දැන්වීමයි</u>

මහජන බැංකුව විසින් පහත සඳහන් සේවාවන් ලබාගැනීම වෙනුවෙන් පිළිගත් සේවා සැපයුම්කරුවන්ගෙන් මුද්‍රා සහිත ටෙන්ඩර්පත් කැඳවනු ලැබේ.

| ටෙන්ඩර් අංකය | විස්තරය | ලංසු ඇපකරයේ වටිනාකම | අයදුම්පත් නිකුත් කරන අවසාන දිනය සහ වේලාව | ටෙන්ඩරය වසනු ලබන දිනය සහ වේලාව |
|---|---|---|---|---|
| P/071/2025 | (Selection of a research agency for Assessment of Efficiency and Satisfaction on customer Touchpoints of People's Bank) | මුළු ඇස්තමේන්තු ගත වටිනාකමින් 3% ක් (රු.මි 5.0 ඉක්මවන්නේ නම්) | 2025.06.09 දින ප.ව 2.00 | 2025.06.11 දින ප.ව 2.00 |

1. ටෙන්ඩර් අයදුම්පත් **2025.05.20 දින සිට 2025.06.09 දින දක්වා** බැංකු වැඩ කරන දිනයන්හිදී **පෙ.ව. 9.00 සිට ප.ව.2.00 දක්වා** කොළඹ 02,කිව් පාර,30/101,පිහිටි මහජන බැංකුවේ සැපයීම් දෙපාර්තමේන්තුවෙන් ලබා ගත හැකි අතර, ඒ සඳහා එක් ටෙන්ඩර් අයදුම් පතක් වෙනුවෙන් ආපසු නොගෙවනු ලබන **රු. 5,000/- ක** ගාස්තුවක් සමඟ අදාල ආයතනයේ අයදුම් ලිපියක්ද මහජන බැංකුව සැපයුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතුය.

2. නිසි පරිදි සකස් කරන ලද ටෙන්ඩර් පත සමග ඉහත වගුවේ සඳහන් වටිනාකමකින් යුත් ලංසු ඇපකරයක් පිළිගත් වාණිජ බැංකුවකින් (මහජන බැංකුව හැර) ලබාගෙන ඉදිරිපත් කළයුතු අතර, එය ටෙන්ඩරය විවෘත කරන දින සිට දින 180 කට වලංගු විය යුතුය. මේ සඳහා දින 180 කට වලංගු බැංකු ගෙවීම් ඇණවුම් හෝ අණකර ඉදිරිපත් කළහැකි අතර , පුද්ගලික චෙක්පත් බාරගනු නොලැබේ. මහජන බැංකුවේ ඕනෑම ආකාරයක ගිණුමක මුදල් ස්වරූපයෙන් ඇති තැන්පතුවක් හා ඊට අදාල හිලව් ලිපියක් වුවද ලංසු බැදුම්කරයක් ලෙස පිළිගත හැක.

3. මුද්‍රා තබන ලද ටෙන්ඩර්පත් මහජන බැංකුව, සැපයීම් දෙපාර්තමේන්තුව, 30/101, කිව් පාර, කොළඹ 02 ලිපිනයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුය. නැතහොත් ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉහත දක්වා ඇති දිනයේදී ප.ව.2.00 ට ටෙන්ඩර් වසනු ලබන අතර, එදින ප.ව. 2.00 න් පසු ලැබෙන ටෙන්ඩර් පත් විවෘත නොකරම ආපසු බාරදෙනු ලැබේ.

4. සියළුම හෝ ඕනෑම ටෙන්ඩරයක් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම සහ කිසිදු හේතුවක් නොදක්වා ටෙන්ඩරයක ඕනෑම කොටසක් හෝ පිළිගැනීමේ අයිතිය මහජන බැංකුව සතුය. අවම මිල පිළිගැනීමට බැංකුව බැඳී නොමැත.

5. මේ පිළිබඳ වැඩි විස්තර ප්‍රධාන කළමනාකාර (සැපයීම්) වෙතින් පහත සඳහන් දුරකථන අංක මගින් ද ලබාගත හැකිය.

**ප්‍රධාන කළමනාකාර (සැපයීම්)**
**මහජන බැංකුව,**
**සැපයීම් දෙපාර්තමේන්තුව**
**නො. 30/101, කිව් පාර, කොළඹ 02**

**දුරකථන අංක : 2439577/8, 2307326**
**ෆැක්ස් : 2439576**
**වෙබ් අඩවිය : www.peoplesbank.lk**
**ඊ මේල් : supplies@peoplesbank.lk**